**කෑගල්ල නගර සභාව**

**කෑගල්ල දිස්ත්‍රික්කය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018. මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූලි 31 දින සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කල මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය වලින් 2017 දෙසැම්බර් 31 දිනට කෑගල්ල නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට රු. 77,684 ක ණය හිමියෝ අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ස්ථාවර තැන්පත් පොළිය රු.5,386,889 ක් වුවත් එය රු. 969,120 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා වර්ෂයේ ආදායම් හා ලැබිය යුතු ආදායම් රු.4,417,769 කින් අඩුවෙන් දැක්වුණි.

**1.3.2 නොසැසඳුණු ගිණුම්**

සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයයන් 04 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු. 46,012,033 ක් වූ නමුත් ඊට අදාළ උපයෝගී ලේඛන/වාර්තා අනුව එකතුව රු. 3,157,792 ක් වූයෙන් වෙනස රු. 42,854,241 ක් විය.

**1.3.3 අවිනිශ්චිත ගිණුම්**

2017 දෙසැම්බර් 31 දිනට අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය වූ රු. 3,657 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**1.3.4 ලැබියයුතු හා ගෙවිය යුතු ගිණුම්**

**(අ) ලැබියයුතු ගිණුම්**

සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ 01 ක් ඉක්ම වූ ලැබියයුතු ගිණුම් ශේෂවල එකතු වටිනාකම රු. 22,333,466 ක් විය.

**(ආ) ගෙවියයුතු ගිණුම්**

සමාලෝචිත වර්ෂය අවසානයට වර්ෂ 01 ක් ඉක්ම වූ ගෙවියයුතු ගිණුම් ශේෂවල එකතු වටිනාකම රු. 20,143,945 ක් විය. ගෙවියයුතු ශේෂය තුල ඇතුලත් නාන තටාකය වැඩිදියුණු කිරීම සඳහා වූ රු.10,000,000 ක් හා මාර්ග වැඩිදියුණු කිරීම සඳහා වූ රු. 3,000,000 ක් ඉටු නොකළ කාර්යයන් සඳහා වූ වෙන් කිරීම් විය.

**1.4 අනුකූල නොවීම**

**1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| | (i) මු.රෙ. 396 (ඇ) | 76,625 | මාස 06 ඉක්මවා තිබුණු නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකල චෙක්පත් 15 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| | (ii) මු.රෙ. 571 | 2,682,487 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධව කටයුතු කර නොතිබුණි. |
| | (iii) මු.රෙ. 1646 | 2,775,995 | සභාවට අයත් වාහන 21 ක ධාවන සටහන් හා මාසික සාරාංශ විගණනය සඳහා ඉදිරිපත්කර නොතිබුණි. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | - | සභාව භාරයේ ඇති වාහන 16 ක ඉන්ධන දහන පරීක්ෂාවක් සිදු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 39,882,387 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 42,086,583 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2017 ඇස්තමේන්තුගත ආදායම | 2017 බිල් කළ ආදායම | 2017 රැස්කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2016 ඇස්තමේන්තුගත ආදායම | 2016 බිල් කළ ආදායම | 2016 රැස්කළ ආදායම | 2016 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 12,227,000 | 12,227,000 | 11,814,738 | 2,637,989 | 11,575,000 | 11,575,000 | 10,725,410 | 4,631,408 |
| (ii) | කුලී | 41,041,582 | 41,689,820 | 41,875,578 | 3,933,411 | 38,815,060 | 38,154,860 | 46,031,746 | 3,665,891 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,656,500 | 2,592,000 | 3,167,284 | 470,120 | 1,749,500 | 1,715,000 | 812,032 | 134,840 |
| (iv) | වෙනත් ආදායම් | 128,394,498 | 128,555,498 | 104,868,665 | 35,474,508 | 129,055,778 | 129,052,278 | 103,996,868 | 37,094,491 |

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම රැස්කල ආදායම සමග සැසඳීමේදී වරිපනම් හා බදු, වෙනත් ආදායම් යන ආදායම් විෂයයන්ගේ රැස්කල ආදායම අයවැයගත ආදායමට වඩා පිළිවෙලින් සියයට 03 ක් හා සියයට 18 කින් අඩු වී තිබුණු අතර බදුකුලී හා බලපත්‍ර ගාස්තු ආදායම් විෂයයන්ගේ රැස්කල ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 2 කින් හා සියයට 19 කින් වැඩි වී තිබුණි.

### 2.2.2 වරිපනම් හා බදු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) යම් වරිපනම් බද්දක් හෝ අක්කර බද්දක් නොගෙවීම සම්බන්ධයෙන් වූ විට එම බද්ද අයවීමට ඇති ස්ථානය අයිතිකරුගේ දේපල තහනමට ගෙන විකිණීමෙන් හෝ මුදල් අයකර ගත යුතු වුවත් නියදි පරීක්ෂාවට අනුව ඉඩම් හිමියන් හා වරිපනම් බදු ස්ථාන 41 කින් වර්ෂ 05 සිට වර්ෂ 32 ක් දක්වා කාලපරිච්ඡේදයකට අදාළව රු.594,002 ක් අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) වාර්ෂික වරිපනම් ගාස්තු අයකිරීම සඳහා වර්ෂ 05 කට වරක් දේපල තක්සේරු කර අයකිරීම් කල යුතු වුවත් 2001 වර්ෂයේ තක්සේරුව මත පදනම්ව 2017 වර්ෂයටද වරිපනම් බදු අයකර තිබුණි. වර්ෂ 15 කට පෙර පැවති තක්සේරු වටිනාකම මත බදු අයකර තිබීම හේතුවෙන් වර්තමාන වටිනාකම මත බදු ආදායම් ලබා ගැනීමේ අවස්ථාව සභාවට අහිමි වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1 කාර්යසාධනය**

--------------------

නගරසභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ

**(අ) අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

----------------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

**(i)** ඔලගම පිහිණුම් තටාකය පළමු අදියර සඳහා 2011 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා රු.8,865,977 ක් වැය කර තිබුණද දෙවන අදියර ආරම්භ නොකිරීම නිසා තටාකය ප්‍රයෝජනයට ගත නොහැකි වීම හේතුවෙන් වැය කළ මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. අඩක් නිමකර තිබුණු පිහිණුම් තටාකය වටා වල් බිහි වී තිබුණු අතර තටාකය ජලයෙන් පිරී පැවතීම හේතුවෙන් මදුරුවන් බෝවීමේ අවදානමක් පැවතුණි.

**(ii)** 2017 අයවැය ලේඛනයට අනුව ප්‍රාග්ධන වැය යටතේ රු. 39,605,000 ක ප්‍රතිපාදන වෙන්කර වටිනාකම රු. 5,436,873 ක් වූ කර්මාන්ත 08 ක් සඳහා ඇස්තමේන්තු සකස් කර තිබුණද සමාලෝචිත වර්ෂය තුල කිසිදු කර්මාන්තයක් ඉටුකර නොතිබුණි.

**(iii)** විමධ්‍යගත අයවැය වැඩසටහන 2017 යටතේ නිදහස් මාවත ළමා උද්‍යානය සඳහා රු.2,209,498 ක පිරිවැයක් දරා ඉදිකිරීම් කටයුතු 2017 දෙසැම්බර් 22 දින නිමකර තිබුණද 2018 මැයි වනවිටත් මහජන උපයෝජනය සඳහා විවෘත කර නොතිබුණි.

**(ආ) පාරිසරික ගැටළු**

------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

**(i)** 2017 ක්‍රියාකාරි සැලැස්මට අනුව පරිසර හා සෞඛ්‍ය අංශයේ අරමුණු අතර 2016 වර්ෂයේ කෑගල්ල නගර සීමාව තුල වාර්තා වූ ඩෙංගු රෝගීන් සංඛ්‍යාව සියයට 50 කින් අඩු කිරීම ඉලක්කය වුවත් 2016 වර්ෂයේ වාර්තා වූ ඩෙංගු රෝගීන් 39 ක සංඛ්‍යාව 2017 වර්ෂය තුල රෝගීන් 180 ක් දක්වා වර්ධනය වී තිබුණි. මේ අනුව 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේ ඩෙංගු රෝගීන්ගේ සියයට 461 ක වර්ධනයක් දක්නට ලැබුණි.

**(ii)** කෑගල්ල රතඹලාවත්ත පොදු වැසිකිලිය හා රෝහල හංදිය අසල පොදු වැසිකිලිය 2014 වර්ෂයේ සිට 2018 මැයි වනවිටත් වසා දමා තිබීම හේතුවෙන් මහජනතාවට පොදු පහසුකම් සැපයීමට අසමත් වී තිබුණි.

(ඇ) **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

-----------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

**(i)** නගර සභා බල ප්‍රදේශයේ දිනකට දළ වශයෙන් ටොන් 15 ක 20 ක කැලි කසළ ප්‍රමාණයක් එකතුවන බව නිරීක්ෂණය වූ අතර එම කැලි කසළ වලින් නොදිරන අපද්‍රව්‍ය බැහැර කිරීමට ස්ථිර විසඳුම් ලබා දී

නොතිබුණි. ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානය අවට කසළ ගොඩගසා තිබුණු අතර කැලිකසළ රැස්කල භූමිය නායයෑමේ අවදානමකට ලක්ව පැවතිණි.

**(ii)** කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය සඳහා භාවිත කරනු ලබන හලර් යන්ත්‍රය 2018 මැයි වනවිටත් අක්‍රිය තත්ත්වයේ පැවතීම නිසා පොහොර නිෂ්පාදනය ඇනහිට තිබුණි.

(iii) කසළ රැස්කරන භූමියට සතුන්ට ඇතුල්විය නොහැකි පරිදි ආරක්ෂා කර නොතිබුණි.

**(ඇ) තිරසාර සංවර්ධන ඉලක්ක**

**-----------------------------**

තිරසාර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍ර පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුලින් සහා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2018 මැයි වනවිටත් සකස් කර නොතිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**----------------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

**(අ)** ආදායමට ගතයුතු රු. 573,638 ක් තැන්පත් ගිණුමේ රඳවා තිබුණි.

**(ආ)** නගර ශාලාව වෙන්කිරීමේදී දිනකට රු. 10,000 ක් තැන්පතු ලෙස ලබාගෙන කාර්යය නිමවීමෙන් පසුව නියමිත මුදල ආදායමට ගෙන ශේෂය පියවිය යුතු වුවත් 2014 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලයට අදාළව රු. 520,750 ක් නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.3 වත්කම් කළමනාකරණය**

**---------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

**(අ)** සභාවට අයත් වාහන 03 ක් හා උපාංග 02 ක් දීර්ඝ කාලයක සිට භාවිතයට ගෙන නොතිබුණි.

**(ආ)** 2017 වර්ෂයේ සභා දේපල සමීක්ෂණයට අනුව කැගල්ල නගර සභාවට අයත්, මෙතෙක් අනාවරණය කර නොතිබුණු සභාව සතු දේපොල 13 ක් සම්බන්ධයෙන් සමීක්ෂණ මණ්ඩලය විසින් ලබා දෙන ලද නිරීක්ෂණ හා යෝජනා 2018 මැයි වනවිටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**----------------------------------------**

**4.1 අයවැය පාලනය**

**-------------------**

සමාලෝචිත වර්ෂය සඳහා අනුමත කර තිබුණු අයවැයගත ප්‍රතිපාදන හා ප්‍රතිපාදන මාරුකිරීම් ද සැලකිල්ලට ගත් විට වැය විෂයයන් 58 ක එකතු ප්‍රතිපාදන රු. 16,183,500 ක් සම්පූර්ණයෙන්මද වැය විෂයයන් 76 ක එකතු ප්‍රතිපාදන රු. 50,199,040 කින් සියයට 30 සිට සියයට 99 දක්වා එකතුව රු. 66,382,540 ක් ද සභා කටයුතු සඳහා යොදා නොගෙන ඉතිරි කර තිබුණි.

**5. පද්ධති හා පාලන**

**--------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) | තැන්පත් ලේඛනය යාවත්කාලීන නොකිරීම |
| | | (ii) | සේවක ණය ලේඛනය යාවත්කාලීන නොකිරීම |
| (ආ) | ස්ථාවර වත්කම් පාලනය | | හඳුනා නොගත් ස්ථාවර වත්කම් පැවතීම |
| (ඇ) | ණයගැති පාලනය | | සභාවට අයවිය යුතු දිගුකාලීන ආදායම් ශේෂ පැවතිම |
| (ඈ) | අයවැය පාලනය | | ප්‍රතිපාදන සැලකිය යුතු ප්‍රමාණයන්ගෙන් ඉතිරි කර තිබීම |
| (ඉ) | වාහන පාලනය | | ගර්හිත හා අලුත්වැඩියා කලයුතු වාහන සම්බන්ධයෙන් කටයුතු නොකිරීම |